# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2013/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 23/07/2024<br>පැය 1410 |


## නවීකරණය කරන ලද ළමා හා කාන්තා කාර්යාංශ විවෘත කිරීම

"ළමුන් හා කාන්තාවන් සඳහා ප්‍රචණ්ඩත්වයෙන් තොර සමාජයක්" යන දැක්ම පෙරදැරි කර ගනිමින් දිවයිනේ පිහිටි පොලිස් ස්ථාන 604ක ස්ථාපිත කර ඇති ළමා හා කාන්තා කාර්යංශ මඟින් ළමුන්ට හා කාන්තාවන්ට සිදුවන වැරදි සම්බන්ධයෙන් පැමිණිලි භාර ගැනීම සිදු කරනු ලබයි. එසේ පැමිණිලි යොමු කිරීමට පැමිණෙන ළමුන් හා කාන්තාවන් වෙනුවෙන් ඔවුන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කර ගනිමින් ඔවුන්ගේ ප්‍රශ්න හා ගැටලු ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීමේ අරමුණින් දිවයිනේ පිහිටි සියළුම පොලිස් ස්ථාන වල ළමා හා කාන්තා කාර්යංශ නවීකරණය කිරීම, සමාජය තුළ කාන්තාවගේ සහ දරුවාගේ ආරක්ෂාව තහවුරු කිරීම අරමුණු කරගනිමින් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උදාරතර සංකල්පයක් මත ටිරාන් අලස් මැතිතුමාගේ සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ අධීක්ෂණය යටතේ ආරම්භ කිරීමට නියමිතව ඇත.

ඒ අනුව දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන වල ස්ථාපිත කර ඇති ළමා හා කාන්තා කාර්යංශ නව සංකල්පයක් යටතේ නවීකරණය කර **2024.07.24 වන දින පස්වරු 04.30ට ප්‍රාදේශීය කොට්ඨාසභාර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් විවෘත කිරීමට නියමිතය. නවීකරණය කරන ලද ළමා හා කාන්තා කාර්යංශ ගොඩනැගිලි විවෘත කිරීමේ උත්සවයට සමගාමීව එහි ප්‍රධාන උත්සවය බම්බලපිටිය පොලිස් ස්ථානයේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.**

මේ වන විට දිවයිනේ සියළුම ළමා හා කාන්තා කාර්යංශ ගොඩනැගිලි වෙනම පිවිසුමක් සහිත වෙන් වූ ස්ථානයක ස්ථාපිත කර ඇති අතර ඇතුලත සුදු පැහැති වර්ණයෙන් ආලේප කර ඇත. ඇතුලත බිත්ති සිතුවම් මඟින් අලංකාර කර ඇති අතර, සියළුම පොලිස් ස්ථාන වල ළමා හා කාන්තා කාර්යංශ ගොඩනැගිලි තුල ඇති භෞතික සම්පත් එකම ආකෘතියක් යටතේ ස්ථානගත කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම සියළුම ළමා හා කාන්තා කාර්යංශ සඳහා අවශ්‍ය වන පරිදි නිලධාරීන් අනුයුක්ත කිරීම සඳහා පියවර ගෙන ඇත.

මෙලෙස නවීකරණය කරන ලද ළමා හා කාන්තා කාර්යංශ ගොඩනැගිලි තුල කාන්තාවන්ගේ සහ ළමුන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි විමර්ශන කටයුතු සිදු කිරීමට හැකියාව ලැබෙන අතර

ළමුන් අනාරක්ෂිත වීම, ලිංගික හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මෙන්ම ළමා මෙහෙකාර සේවයේ යෙදවීම වැනි  දරුවන්ට හා කාන්තාවන්ට මුහුණු දීමට සිදු වන ඕනෑම ආකාරයේ අපරාධයකින් වින්දිතයින් බවට පත් වන දරුවන් හා කාන්තාවන් වෙනුවෙන් යුක්තිය ඉටු කරලමින් ඔවුන් සුරක්ෂිත කිරීම සඳහා දිවයින පුරා පොලිස් ස්ථාන ආවරණය වන පරිදි ළමා හා කාන්තා කාර්යංශ වල රාජකාරී නියුතු පොලිස් නිලධාරිනියන් හා පොලිස් නිලධාරීන් විසින් කටයුතු කෙරෙනු ඇත .

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**